**<u>ගිණුම්කරණය - 3 - ද්විත්ව සටහන් ක්‍රමය මගින් ගනුදෙනු ගිණුම්ගත කිරීම</u>**

නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

1.ද්විත්ව සටහන් රීතිය නිවැරදිව දක්වා නැති වගන්තිය තෝරන්න.

1.වගකීම් වැඩිවීම , ආදායම් වැඩිවීම - හර
2.වියදම් වැඩිවීම,වත්කම් වැඩිවීම - හර
3.වගකීම් අඩුවීම,හිමිකම් අඩුවීම - හර
4.වගකීම් වැඩිවීම,ආදායම් වැඩිවීම - බැර
5.ආදායම් අඩුවීම,වත්කම් වැඩිවීම - හර

2.ගිණුම් සියල්ල එකතු වන ස්ථානය වන්නේ,

1.ජර්නලයයි.
2.ලෙජරයයි.
3.ශේෂ පිරික්සුමයි.
4.මූලික පොතයි.
5.ආදායම් ප්‍රකාශනයයි.

3.ව්‍යාපාරික ගනුදෙනු හා සිදුවීම්වල ද්විත්ව ස්වරූපය නිශ්චිත දිනක සිට තවත් නිශ්චිත දිනයක් දක්වා අනුපිළිවෙලින් වාර්තා කරන්නේ,

1.මූලික පොත්වලය.
2.ජර්නල්වලය.
3.ගිණුම් තුළය.
4.ශේෂ පිරික්සුම තුළය.
5.ආදායම් ප්‍රකාශය තුළය.

4.ලෙජරයේ පවතින ගිණුම් වර්ග 5ට අයත් නොවන්නේ,

1.වත්කම් ගිණුම්
2.වගකීම් ගිණුම්
3.ගැනිලි ගිණුම්
4.හිමිකම් ගිණුම්
5.ආදායම් ගිණුම්

5.පහත නිවැරදිව ද්විත්ව සටහන දක්වා නොමැති වගන්තිය තෝරන්න.

1.ව්‍යාපාරයේ පාවිච්චියට ලී බඩු මිලට ගැනීම.- ලී බඩු ගිණුම - හර
මුදල් ගිණුම - බැර

2.බඩු තොගයක් ණයට විකිණීම.- ණයහිමි ගිණුම - හර

විකුණුම් ගිණුම - බැර

3.සේවක වේතන ගෙවීම - සේවක වේතන ගිණුම - හර

මුදල් ගිණුම - බැර

4.අයිතිකරු මුදල් ගැනිලි සිදු කිරීම - ගැනිලි ගිණුම - හර

මුදල් ගිණුම - බැර

5.බැංකු ණය වාරිකය ගෙවීම,වාරිකය තුළ පොලියද ඇතුළත්ය.

බැංකු ණය ගිණුම - හර

බැංකු ණය පොලී ගිණුම - හර

මුදල් ගිණුම - බැර

පහත වගන්තිවල හිස්තැන් පුරවන්න.

6.ගිණුම්කරණයේ පියා වන්නේ ..........................................ය.

7.වත්කම් හා ...............................පිළිබඳ ද්විත්ව සටහන් රීතිය එකිනෙකට සමාන වේ.

8.ගිණුම්කරණ ඒකකයක ඇතිවන මූල්‍යමය ගනුදෙනු වාර්තා කරන සම්මත ආකෘතිය වන්නේ .........................යි.

9.වියදම් වැඩිවීම හිමිකම ......................අතර ආදායම් වැඩිවීම හිමිකම ..........................වේ.

10.ගනුදෙනුවක් ව්‍යාපාරයකට දෙයාකාරයකට බලපාන අතර එම බලපෑම එකවර සටහන් කරන්නේ ..................................ක්‍රමයටයි.

සකස් කළේ -

ර/ඇඹිලිපොල ශ්‍රී මහින්ද ම.වි.